

# හිම බිමේ සුදු රෝස 14

විද්‍යානි මනතුංග ලියයි

**මෙතෙක් කතාව**

*උසස් අධ්‍යාපනය සඳහා පර්ත් පැමිණෙන ලහිරුට එහිදී ටාන්‍යා මුණගැසේ. ඕස්ට්‍රේලියානු සංස්කෘතිය තුල හැදී වැඩී තිබුනද ටාන්‍යා වෙතින් දිස්වෙන නිහතමානී අහිංසක ගති පැවතුම් වෙතට සිත ඇදී යන ලහිරු, ජීවිතයේ මෙතෙක් අත්විඳ නොතිබූ සංවේදීත්වයක් ඇය නිසා සිය හදවත හිමි කරගෙන සිටින බව කල්‍යාමේදී තේරුම් ගනියි. නමුත් ටාන්‍යා තමා අසලක වෙත්දී අකාරුණික ලෙස නිරතුරුවම ඇය ප්‍රතික්ෂේප කල ලහිරු උපාධි ප්‍රධානෝත්සවය දා රාත්‍රියේ, එදා ඒ අසංවේදී අතීතය මත තමා සිත්තම් වීමට ඉඩහැරියේ ප්‍රමාදයක අමිහිරි වූ සත්‍යය බව වේදනාකාරී ලෙස හෙලිදරව් කරගනී. ටාන්‍යාගේ ආදරය තමාගේම මිතුරෙකු වන මහේලට හිමිවීමත් සමඟ මව්බිම කරා යන ලහිරු, හදවතේ තමා විසින්ම මිහිදන් කරවනු ලැබූ සොඳුරු ආදරයක මතක සටහන් සමඟ හුදකලා දිවියකට මුලපුරයි. තවත් වසර කිහිපයකට පසු මහේල වෙනත් කෙනෙකු සමඟ හදිසියේම විවාහවීම නිසා නොසන්සුන් වන ලහිරු නැවත වරක් පර්ත් පැමිනෙන්නේ ටාන්‍යා වෙනුවෙන් වූ ප්‍රාර්ථනා ගොන්නක් පොදි බැඳගෙනය. එහෙත් පෙර බොහෝ අවස්ථා වලදී මෙන්ම මෙවරද බලාපොරොත්තු නොවන්නක්ම ශ්‍රවණයකරන ලහිරු එයින් බලවත්සේ කම්පනයට පත්වීම නිසා අනතුරකට මුහුණපායි.*

අද එතැන් සිට....

-තීරණයකට....”

“ඔව් ලහිරු.... කරන්න ඕනැ මොකක්ද කියන එක මම දැන් දන්නව...”

ඇය නොකියා ඒ ගැන ඇසීමට මට අයිතියක් නොමැත. මම නිහඬ වීමි. ඉන්පසු අප විවිධ දෑ පිළිබඳව කතා බහ කළ ද පෞද්ගලික තොරතුරු කිසිවක් නැවත මතුකර ගත්තේ නැත.

දින කිහිපයක් මෙසේ අප මුණගැසුනද ඒ සියලුම දින විශේෂ සිදුවීමකින් තොරව ගෙවී ගියේය. දිනක් ටාන්‍යා මගෙන් කළ එක්තරා ඉල්ලීමකට මා එකඟ වූයේ එය ප්‍රතික්ෂේප කල නොහැකි ම වූ බැවිනි.

“ලහිරු... ඔයාගෙන් මට එක උදව්වක් ඉල්ලන්න තියනවා...”

“කියන්න... මට පුළුවන් දෙයක් නම් මම කරන්නම්...”

“හෙට මගේ අක්කගෙ පස්වන විවාහ සංවත්සරය... ඒ වෙනුවෙන් බීච් එකේ පොඩි උත්සවයක් තියනව. ලහිරුට කරදරයක් නෙමෙයි නම් ඔයත් එනව ද?”

“ඒකට මම එන එක ඔයාට උදව්වක් වෙන්නෙ කොහොම ද?” ඇය ඊට මුලින් ම කළේ සිනාසීම ය.

“හැමදාම අපේ ගෙදර එන එක ඔයා ප්‍රතික්ෂේප කරනව... ඒකෙන් ඇඟවෙන්නෙ අසතුට”අකැමැත්ත වගේ දෙයක්.. මේක තියෙන්නෙ ගෙදර නෙමෙයි බීච් එකේ... ඒ නිසාවත් ඔයා එයි ද කියල මට හිතුන...”

මම තවදුරටත් නිදහසට කාරණා ඉදිරිපත් කිරීමට නොගියෙමි. එහෙත් මා ඒ ඉහත ඉල්ලීම් සියල්ලට ම පිටුපෑවේ මහේලගේ ක්‍රියාව නිසා මා ලජ්ජාවට පත්වී සිටි බැවිනි. අපි සියල්ලෝ ම එකම රටකට, එකම ජාතියකට අයත් වූවා නම් ඔහු අප අතර තවත් එක්තරා පුද්ගලයෙක් පමණි යන හැඟීම පැවතීමට ඉඩ තිබිනි. නමුත් ටාන්‍යාගේ පවුල කෙරෙහි ‘මාත් මහේලත් අතර වෙනසක් නැත්තේ ය’ යන හැඟීම පුන පුනා ටාන්‍යාගේ පවුලේ අය මුණගැසීම ප්‍රතික්ෂේප කිරීමට මා පොළඹවන ලදී.

පසු දා සෙනසුරාදා දිනයක් විය. නිවස ඉදිරිපස තිබූ මුහුදු වෙරළේ ඔවුන් කුඩා උත්සවයක් සූදානම් කර තිබිණි. ටාන්‍යා ද එදා පියකරුව හැඳ පැළඳ සිටීම මගේ සිත සතුටට පත් කළේ ය. ලා රෝස පැහැති ගවුමක්, රෝස මල් පොකුරක් ගවසා සකස් කර තිබූ පුළුල් වාටියක් සහිත රෝස පාට තොප්පියත් ටාන්‍යාට හිමිකර දී තිබුණේ කිව නොහැකි තරම් සුන්දරත්වයකි. ටාන්‍යාගේ පවුලේ අය මා පිළිගත්තේත්, කතා බහ කළේත් සාමාන්‍ය සුහදත්වයක් පළකරමින් වීම අපහසුවකින් තොරව ඒ සන්ධ්‍යාව ගත කිරීමට මට බොහෝ ඉවහල් විය.

උත්සවය අතරමැද දී ටාන්‍යාගේ මව මදකට අප අසල රැඳෙමින් මගේ සුවදුක් විචාරමින් සිටියේය. අප සිටගෙන සිටියේ පිරිසට මදක් ඈතින් වූ අතර එවේලේ අප අසලට පැමිණි මැදිවිය ද පසුකරමින් සිටි කාන්තාවකට ටාන්‍යා මා හඳුන්වා දුන්නේ එතරම් සතුටකින් නොවේ යැයි මට සිතිනි.

“මේ ලහිරු... මේ මගෙ ආන්ටි කෙනෙක්... නම ඉවෝන්...” සතුට හඟවමින් ඇගේ සුරත මා පිළිගත්ත ද ඇය එපමණකින් නැවතුනේ නැත.

“ටාන්‍යා විවාහ ගිවිසගෙන හිටිය කෙනාගෙ නම මහේල ද... මොකක් ද නේද...?” ටාන්‍යා ඒ කතාවෙන් සසල වනවා මම දුටුවෙමි. ‘නාකි වෙලත් අනුන්ගෙ ඇද කුද හොයනවට වඩා දෙයක් නැතුව වගෙයි’ මා සිතේ නැග ආවේ අධික කෝපයකි. ටාන්‍යාගේ මව නිරුත්තර බවක් මොහොතකට හෝ පළ කළේ මා අසලක නිසා විය හැකි ය. නමුත් මම දෙවරක් සිතමින් සිටියේ නැත.

“ඔව්... මගේ මැද නම තමයි ඒ... නමුත් මම වඩා කැමැති ලහිරු කියනවටයි...”

ටාන්‍යාගේ මව නිහඬවම අප අසලින් ඉවත්වීමට ද, ටාන්‍යාගේ මුනිවත රැකීමට ද මගේ ඒ ප්‍රතිචාරය හේතු වූ බව දැනී ගිය ද ඒගැන පමණක් නොව, ඉන්පසුව ද දිගටම අප අසල රැඳෙමින් කතාබහේ යෙදී සිටි එම කාන්තාව කෙරෙහි ද මම එතරම් සැලකිල්ලක් නොදැක්වූයෙමි. වැරද්දක් කෙලින් දැකීමත් එයට ප්‍රතිචාරය මෙවැන්නක් විය යුතුයැයි වැටහීයන දෙයක් වේ නම් එය මුහුණටම කියාදැමීමත් යන මගේ ඒ ගතිය ගැන මම කිසිවිටෙකත් කනගාටුවූයේ නැත. නමුත් ටාන්‍යා ඒවනවිට එහෙම්පිටින් ම වෙනස් වී සිටියා ය. ඈ ඉක්මනින් ම පිරිසෙන් සමුගෙන ආවේ මා ඇරලවීමට යයි කියමිනි. ඔවුන්ගෙන් ඈත්වී වැඩි දුරක් යාමට පෙර ඇය ම කතාව ඇරැඹුවා ය.
“මට සමාවෙන්න ලහිරු... ඔයාව ලොකු අපහසුවකට මම පත් කළේ...”
“මට කිසි ම අපහසුවක් වුණේ නැහැ ටාන්‍යා... මේක දැන් මෙතනින් ම අමතක කරල දාන්න...”
මා වාහනයට නංවාගත් ඇය ටික දුරක් යන තුරුම නිහඬ ව වාහනය පදවාගෙන ආව ද එය මුළුමනින් ම අමතක කර නොමැති බවක් පළකළේය.
“ලහිරු...”
“ඇයි ටාන්‍යා...?”
“ඔයා හිතනව ද ලහිරු මෙවැනි අවස්ථාවක් ගැන අනුමාන කරල ඔයාව එක්කගෙන එන්න මම උනන්දු වුණා කියල...?”
“මම මොහොතකට වත් එහෙම හිතුවෙ නැහැ ටාන්‍යා... මම ඔයාට වතාවකුත් කිව්වනෙ ඕක අමතක කරන්න කියල...”
“කොහොම වුණත් මම ඔයාගෙන් සමාව ඉල්ලා සිටිනව ඒ ගැන ලහිරු...”
“හොඳයි මම ඔයාට සමාව දෙනව. ඒ වගේ ම එහෙමවත් ඔයා වෙනුවෙන් දෙයක් කරන්න මට අවස්ථාවක් ලබා දීපු ඔයාගෙ ඉවෝන් ආන්ටිට මම ස්තුතිවන්ත වෙනව...”
ඈ සිනාසෙන්නට විය. ඇත්තෙන් ම ඒ සිදුවීමත් ඒ වෙනුවෙන් මා දැක්වූ ප්‍රතිචාරයත් පිළිබඳ මම ඒ වනවිට සතුටට පත්වී සිටියෙමි.
.....

අපි දිනපතා ම වාගේ මුණගැසුනෙමු. පෞද්ගලික තොරතුරු හැරුණ විට අනිත් සෑම දෙයක් ම වාගේ අපේ කතාබහට මාතෘකා වී තිබිණි. ඉන්පසු මට ටාන්‍යාගේ පවුලේ අය කිසිවෙක් මුණගැසුනේ නැත. නමුත් තාත්තාට කතා කර රෝහලේ වියහියදම් වෙනුවෙන් ටාන්‍යාගේ පියා යටකර තිබූ මුදල ඔහුට පියවා දැමීමට හැකි වීම මට මහත් සහනයක් විය.

ටාන්‍යා මේ වන විට සාමාන්‍ය තත්වයකට පත් වී ඇතැයි මට සිතිනි. ඇගේ සුපුරුදු පිළිවෙතේ වෙනසක් කිසිදිනෙක මා දුටුවේ නැත. නමුත් මුල් දිනවල ඈ සිටියේ මානසික වශයෙන් දැඩි ලෙස පීඩා විඳිමිනි.

අපේ පෞද්ගලික ජීවිතය නැවත මාතෘකාව කර ගැනීමට අවැසි තත්වයක් දිනක් අප අතර බිහි විය. පර්ත් නගර මධ්‍යයේ තිබූ තැපැල් කාර්යාලය ඉදිරිපස ගල් පඩිපෙලේ පඩියක් මත වාඩිවී අප දෙදෙනාම සිටියේ නිස්කලංක හැඟීමකින් යුක්තවය. අවට අප වැනිම වූත්, අවිවේකීව එහා මෙහා නෙනැවතී ගමන් ගත් පිරිසත් බොහෝ විය.
“ටාන්‍යා.....”

“ඇයි ලහිරු..”

“මට රස්සාව ඕනෙ නම් ඉක්මනට ආපහු යන්න වෙලා තියෙනව ටාන්‍යා...”

“ඔයාගෙ රස්සාව ඕනැ නේද ඔයාට ලහිරු...” මා ඊට පිළිතුරු ලෙසට කිසිවක් කියන්නට ගියේ නැත. මගේ මෝඩකම් වලට කවුරුවත් පළි නැත.

“රස්සාව නැති කරගන්නට වඩා ඔයා ආපහු ගියොත් නේද හොඳ ලහිරු...” කාටවත් ඕනැ දේ නොව මම මට ඕනැ දේ කරමියි සිතා නිහඬ වීමි. මද වේලාවක් නිහඬව සිට නැවත කතාව අරඹන ලද්දේ ඇයම ය.

“ඔයාගෙන් අහන්න දෙයක් මට තියනව ලහිරු”
“මොකක්ද ටාන්‍ය...?”
“ඔයා මේ ඇවිත් ඉන්න ගමනෙ අරමුණ මොකක් ද ලහිරු... ?”

මම සිනහ වීමි. නැතහොත් ඉබේට ම මට සිනහ ගියේ ය. මීට කලකට ඉහත මේ බිමේ දී මම ඔය ප්‍රශ්නය මගෙන් ම අසා ගතිතෙමි. එදා ඒ ගමනට අරමුණ වූ

